ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - ජලි 2025

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

---

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම සුදුසු පිළිතුරට අදාල අංකයද, ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති එක් එක් ප්‍රකාශය **'සත්‍ය'** හෝ **'අසත්‍ය'** හා ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි උත්තරය ප්‍රශ්න අංකය සමඟ උත්තර පොතේ ලියන ලෙස අයදුම්කරුවන් වෙත උපදෙස් ලබා දී තිබුණි.

අයදුම්කරුවන් එක් එක් අනු කොටස් සඳහා ලබා දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කිහිපයක් පහත පරිදි වේ:

**ප්‍රශ්න අංක 1.1**

මෙම ප්‍රශ්නය මගින් "මූල්‍ය ගිණුම්කරණයේ අරමුණක්" වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. මේ සඳහා සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුර අංක 2 ලබා දී තිබුණත්, සමහර අයදුම්කරුවන් අංක 1 ලෙස වැරදි පිළිතුරක් සඳහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.2**

ඉදිරිපත් කර ඇති කාණ්ඩ අතුරෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූලිකාංග සමන්විත වන්නේ කුමන කාණ්ඩයේ ද යන්න විමසා තිබුණි. මේ සඳහා සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදි උත්තරය වන අංක 3 ඉදිරිපත් කර තිබුණු අතර සමහර අයදුම්කරුවන් අංක 1 හෝ 2 යන වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.3**

මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයක් වන්නේ කුමක්ද විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි උත්තරය වන අංක 2 "අදාල බව" ඉදිරිපත් කර තිබූ අතර, සමහර අයදුම්කරුවන් අංක 1 "අඛණ්ඩ පැවැත්ම" හා අංක 3 "උපචිත පදනම"ලෙස වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.4**

ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය සම්බන්ධයෙන් අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය වන අංක 1 "ගැලපුම් සංකල්පය" ඉදිරිපත් කර තිබූ අතර සමහර අයදුම්කරුවන් අංක 2 "උපචිත සංකල්පය" හෝ අංක 3 "අඛණ්ඩ පැවැත්ම" පිළිබඳ සංකල්පය ලෙස වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.5**

ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කර ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් ශුද්ධ ලාභය නිවැරදිව ගණනය කර අංක 1 රු.2,700,000/- ලෙස ඉදිරිපත් කර තිබූ අතර, සමහර අයදුම්කරුවන් විසින් වැරදි ගණනය කිරීම මත පදනම්ව අංක 2 රු.1,700,000/- හෝ අංක 4 රු.2,500,000/- ලෙස වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.6**

ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ සමීකරණය සඳහා දී ඇති ගනුදෙනු අතුරින් වඩාත්ම ගැලපෙන ගනුදෙනුව කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය වන අංක 2 ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.7**

ඉදිරිපත් කර ඇති කරුණු අතරින් වෙළඳ ණයහිමියකුට සිදු කළ ගෙවීමක් නිසා ගිණුම්කරණ මූලිකාංග මත වන බලපෑම තෝරන්න සඳහා උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය වන අංක 3 "වත්කම් අඩුවීම හා වගකීම් අඩුවීම" යනුවෙන් ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.8**

ඉදිරිපත් කර ඇති ගනුදෙනු අතරින් පොදු ජර්නලයේ සටහන් කරනු ලබන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය වන අංක 2 ඉදිරිපත් කර තිබුණ අතර, සමහර අයදුම්කරුවන් විසින් අංක 3 හෝ 4 ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.9**

මෙම ප්‍රශ්නය මඟින් මූලාශ්‍ර ලියවිලි පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය වන අංක 01 "හරපත" ඉදිරිපත් කර තිබූ අතර, තවත් සමහර අයදුම්කරුවන් විසින් වැරදි උත්තරයක් වන අංක 3 "බැරපත" ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.10**

මෙම ප්‍රශ්නය මඟින් දී ඇති ප්‍රකාශ අතුරින් ද්විත්ව සටහන් ගිණුම්කරණ ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය වන අංක 4 ඉදිරිපත් කර තිබූ අතර, තවත් සමහර අයදුම්කරුවන් අංක 2 හෝ 3 යන වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා අයදුම්කරුවන් වෙත ලබා දී ඇති එක් එක් ප්‍රකාශය **"සත්‍ය"**හෝ **"අසත්‍ය"** ලෙස උත්තර පත්‍රයේ සඳහන් කළ යුතුය.

බොහොමයක් අයදුම්කරුවන් විසින් ප්‍රශ්න අංක **1.11, 1.13** හා **1.14** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

බොහොමයක් අයදුම්කරුවන් විසින් ප්‍රශ්න අංක **1.12** හා **1.15** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් පිළිබඳ නිවැරදිව අවබෝධයක් නොතිබීම මත නිවැරදි උත්තර **"සත්‍ය"** වෙනුවට **"අසත්‍ය"** යනුවෙන් ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර ප්‍රශ්න අංක සමග උත්තර පත්‍රයේ සඳහන් කළ යුතු විය.

**ප්‍රශ්න අංක 1.16**

මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය අතර ඇති විය හැකි කාල වෙනස්කම් (ඔසපැ ඃසගෛැරුබජ්ි) සඳහා හේතු දෙකක් සඳහන් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි කරුණු වන තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් පත් හා නිකුත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් යනාදිය ඉදිරිපත් කර තිබූ අතර, සමහර අයදුම්කරුවන් විසින් මුදල් පොත සංශෝධනය කිරීමට අදාල වූ කරුණුද ඉදිරිපත් කර තිබුණි. උදාහරණ ලෙස බැංකුව විසින් කරන ලද ලබන සෘජු හර හා බැර කිරීම්.

**ප්‍රශ්න අංක 1.17**

ජංගම වත්කමක් සහ ජංගම නොවන වත්කමක් අතර ඇති වෙනස සඳහන් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් වෙත මේ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති බැවින් සම්පූර්ණ නිවැරදි පිළිතුර ඉදිරිපත් කර නොතිබුණි. සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් වාර්තා කරන ලද දිනට මාස 12 ක් තුළ උපලබ්ධි වන වත්කම් ජංගම වත්කම් ලෙසද, මාස 12 කට පසුව උපලබ්ධි වන වත්කම් ජංගම නොවන වත්කම් ලෙසද නිවැරදිව උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.18**

(1) හා (2) ට අදාල එක් එක් ගනුදෙනුව වාර්තා කිරීම සඳහා භාවිතා කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල හඳුනා දක්වන්න යනුවෙන් උපදෙස් ලබාදී තිබුණි. අංක 1 හා 2 සඳහා ලදුපත හා ගැණුම් ඉන්වොයිසිය ලෙස නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර, සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි. උදාහරණ (1) මුදල් ලැබීම් ජනලය - හරපත (2) විකුණුම් ඉන්වොයිසිය, ජර්නලය, පොදු ලෙජරය.

**ප්‍රශ්න අංක 1.19**

අස්තිත්වයකට ව්‍යාපාර ආචාරධර්ම වැදගත් වන්නේ ඇයි දැයි යන්නට හේතු දෙකක් සඳහන් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර තවත් සමහර අයදුම්කරුවන්ට මේ පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති බැවින් වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.20**

අස්තිත්වයක් සඳහා ගිණුම්කරණ සංකල්පය අවශ්‍ය වීමට හේතු දෙකක් ලැයිස්තුගත කිරීමට උපදෙස් ලබා දී තිබුණි. අයදුම්කරුවන් සැලකිය යුතු පිරිසක් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර සුළු අයදුම්කරුන් ප්‍රමාණයක් මේ පිළිබඳ අවබෝධයන් නොමැති වීම නිසා වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

## B - කොටස

### ප්‍රශ්න අංක **02** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම් / නිෂ්පාදන පිරිවැය ලේඛණය පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නය මඟින් සිදුකර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණු අතර පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) නිවැරදි ආකෘතිය භාවිත කර නොතිබුණි.

(2) නොනිමි වැඩ ප්‍රාථමික පිරිවැයට ගැලපීම් නොකර නිෂ්පාදන පිරිවැයට ගැලපීම් කර තිබුණි.

(3) ඍජු චේතන හා නිෂ්පාදනය මත සේවකයන්ට ගෙවන ලද දිරි දීමනාව, ඍජු වියදම් යටතේ ගැලපීම් කළ යුතු වුවද, සමහර අයදුම්කරුවන් පොදුකාර්ය වියදම් ලෙස සටහන් කර තිබුණි.

(4) අමුද්‍රව්‍ය අවසාන තොගය අමුද්‍රව්‍ය මුල් තොගය ලෙස මාරු කර ඉදිරිපත් කර තිබුණි.

(5) නිෂ්පාදන පිරිවැය මත 18% ක ලාභ අතිරික්තය ගණනය කර නොතිබුණි.

(6) පාරිභෝජනය කළ අමුද්‍රව්‍ය, ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන ලද අගයන් හි සඳහන් නොවීය.

(7) විදුලිය, ජලය සහ කුලිය සඳහා ලබා දී ඇති ප්‍රතිශත භාවිතා කිරීමෙන් කර්මාන්තශාලා සහ කාර්යාලය අතර පොදුකාර්ය වියදම් නිවැරදිව ගණනය කර නොතිබුණි.

### ප්‍රශ්න අංක **03** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නයෙන්, ලෙජර් ගිණුම් පිළියෙල කිරීමෙන් පසු ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර පොදුවේ පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(1) ශේෂ පිරික්සුම සකස් කිරීම වෙනුවට සමහර අයදුම්කරුවන් ලෙජර් ගිණුම පමණක් පිළියෙල කර තිබුණි.

(2) ශේෂ පිරික්සුමේ හර විය යුතු සංඛ්‍යා බැරට ද, බැර විය යුතු සංඛ්‍යා හරටද සටහන් කර තිබුණි.

(3) ණයට විකුණුම් හා ණයට ගැනුම් ණයගැති හා ණය හිමි පාලන ගිණුම තුළින් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(4) අත්පිට විකුණුම්, ණයට විකුණුම් හා අත්පිට ගැනුම්, ණයට ගැනුම් ශේෂ පිරික්සුමේ වෙන වෙනම අයිතමයන් ලෙස සටහන් කිරීම.

(5) 2025 ජනවාරි 01 දින මිලදී ගන්නා ලද බෙදාහැරීම් වෑන් රථය සඳහා මාස 03 ක ක්ෂය වීම නිවැරදිව ගණනය කර නොතිබුණි.

(6) සුළු මුදල් පොතට මාරු කරන ලද මුදලින් ගෙවීම් කළ සුළු වියදම් අඩු කළ පසු රු.75,000/- ක නිවැරදි සුළු මුදල් ශේෂය ශේෂ පිරික්සුමේ සඳහන් කර නොතිබුණි.

(7) සුළු මුදලින් කරන ලද එක් එක් වියදම් අනුව වර්ග නොකර එම වියදම් වල එකතුවක් වශයෙන් ශේෂ පිරික්සුමේ සඳහන් කර තිබුණි.

(8) 2024 ඔක්තෝම්බර් 01 දින 10% බැගින් වූ වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ආරම්භ කරන ලද ස්ථාවර තැන්පතුවට අදාලව මාස 06ක පොළී ආදායම නිවැරදිව ගණනය කර ශේෂ පිරිසුමේ සඳහන් කර නොතිබිණි.

(9) දුරකථන සහ අන්තර්ජාල ගාස්තු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා උපචිත වියදම සමඟ නිවැරදිව ගණනය කර නොතිබුණි.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

අතර මෙම ප්‍රශ්නය **(a)** හා **(b)** ලෙස කොටස් දෙකකින් සමන්විතය.

**(a) කොටසින්** වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කිරීමටත් **(b) කොටසින්** අවිනිශ්චිත ගිණුම පිළියෙළ කිරීමටත් උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් සතුටුදායක මට්ටමක පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර, පහත සඳහන් දුර්වලතා හා වැරදි පොදුවේ දක්නට ලැබුණිඃ

**(a)**

(1) ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙල කර තිබීම.

(2) ජර්නල් සටහනට අදාල හර හා බැර අගයන් ජර්නල් සටහන් ලිවීමේදී මාරුකර ඉදිරිපත් කර තිබුණි.

(3) ජර්නල් සටහන් පිළියෙල කිරීමේදී ජර්නලයේ ගනුදෙනුව ඉදිරියෙන් හර හා බැර යනුවෙන් සටහන් කර නොතිබුණි.

(4) අවිනිශ්චිත ගිණුම මඟින් නිවැරදි කළ යුතු වැරදි සටහන් හඳුනාගෙන නොතිබීම.

(5) අයිතම අංක 1 ට අදාලව 2024 අප්‍රේල් 01 දින රු.60,000/- කට මිලදී ගන්නා ලද කාර්යාල උපකරණ වෙනුවෙන් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 25% බැගින් ක්ෂය වීම නිවැරදිව ගණනය කර නොතිබුණු අතර, සමහර අයදුම්කරුවන් විසින් ක්ෂය වීමට අදාල ජර්නල් සටහන ඉදිරිපත් කර නොතිබිණි.

(6) අයිතම අංක 3 හි සඳහන් වරද නිවැරදිව තේරුම් නොගෙන කුලී වියදම් ගිණුම හා කුලී ආදායම් ගිණුම සඳහා පමණක් ජර්නල් සටහන ඉදිරිපත් කර තිබුණි.

(7) අයිතම අංක 6 හි සඳහන් වරද නිවැරදිව තේරුම් නොගෙන රු.4,500/- ක හා රු.5,400/- ක් යන අගයන්ගේ වෙනස වන රු.900/- වෙනුවට එම අගයන් දෙක ජර්නල් සටහන් මගින් ඉදිරිපත් කර තිබුණි.

(**b**) අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය ගිණුමේ බැර ලෙස සටහන් කර තිබුණි.

(2) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය අවිනිශ්චිත ගිණුමේ හර පැත්තේ සටහන් කර නොතිබුණි.

(3) අවිනිශ්චිත ගිණුමට අදාල හර සටහන් එම ගිණුමේ බැර පැත්තේ ද බැර සටහන් එම ගිණුමේ හර පැත්තේ ද වශයෙන් පැති මාරු කර ගිණුමේ සටහන් කර තිබුණි.

(4) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය අවිනිශ්චිත ගිණුමේ පහළට ගෙනගිය ශේෂය ලෙස සටහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය (**A**) හා (**B**) වශයෙන් අනු කොටස් දෙකකින් සමන්විත වේ.

(**A**) **කොටස** මඟින් දී ඇති එක් එක් ගනුදෙනුව තුළින් ගිණුම්කරන සමීකරණයට වන බලපෑම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි.

(**B**) **කොටසින්** ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන (**a**) ගලපන ලද මුදල් පාලන ගිණුම හා (**b**) 2025 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමට උපදෙස් ලබා දී තිබුණි.

(**A**) **ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම්:**

(1) ඉදිරිපත් කර ඇති එක් එක් ගනුදෙනු මඟින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පිළිබඳව එනම් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් වැඩිවීම හෝ අඩු වීම පිළිබඳව සමහර අයදුම්කරුවන් තුළ නිවැරදි අවබෝධයක් නොමැතිව සමීකරණයේ ධන හා ඍණ අගයන් රහිතව සටහන් ඉදිරිපත් කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන් අදාල ගනුදෙනු මඟින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වත්කම් පැත්තේ හෝ වගකීම් පැත්තේ පමණක් තනි සටහනක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(3) ගිණුම්කරණ සමීකරණයේ, දී ඇති ගනුදෙනු වල මූල්‍යමය අගයන් සටහන් කිරීම වෙනුවට "වැඩි වීම" "අඩු වීම" යනුවෙන් වචනයෙන් සඳහන් කර තිබුණි.

(**B**) කොටස

(**a**) **මුදල් පාලන ගිණුම (මුදල් පොත) පිළියෙළ කිරීමේදී පොදුවේ නිරීක්ෂණය වූ දුර්වලතා:**

(1) ලබා දී ඇති ගනුදෙනු අතරින් මුදල්පොත සංශෝධනය කළ යුතු ගනුදෙනු හා බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පෙන්විය යුතු ගනුදෙනු පිළිබඳ නිවැරදි අවබෝධයක් සමහර අයදුම්කරුවන් තුළ නොතිබිණි.

(2) මුදල් පාලන ගිණුමට බැර කළ යුතු ගනුදෙනු හර කර තිබූ අතර, හර කල යුතු ගනුදෙනු බැර කර තිබුණි.

(3) මුදල් පොතේ රු.26,500/- ක ආරම්භක හර ශේෂය සංශෝධිත මුදල් පොත සකස් කිරීමේදී සමහර අයදුම්කරුවන් විසින් එම ශේෂය බැරට ඇතුළත් කර තිබුණි.

(4) සංශෝධිත මුදල් පොත තුලනය කර අවසාන ශේෂය ඉදිරියට ගෙන නොතිබිණි.

**(b) බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී නිරීක්ෂණය වූ පොදු දුර්වලතා:**

(1) බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ඇතුළත් කළ යුත්තේ කුමන ආකාරයේ ගනුදෙනු ද යන්න පිළිබඳව අයදුම්කරුවන් තුළ පැහැදිලි අවබෝධයක් නොතිබීම නිසා, මුදල් පොතේ සටහන් කළ යුතු ගනුදෙනු බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සටහන් කර තිබුණි.

(2) සංශෝධිත මුදල් පොතේ හර ශේෂය අනුව සමහර අයදුම්කරුවන් විසින් සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනයේ "ඉදිරිපත් නොවූ චෙක්පත්" එකතු කිරීම වෙනුවට, අඩු කර තිබූ අතර "තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්" අඩු කිරීම වෙනුවට එකතු කර තිබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(a)** හා **(b)** වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම සහ **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. සමස්ත කාර්යසාධනය හොඳ මට්ටම පැවතුණි.

පොදුවේ නිරීක්ෂණය වූ වැරදි හා අඩුපාඩු පහත පරිදි වේ:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙළ කිරීම:**

(1) වර්ෂයට අදාල නිවැරදි ක්ෂය ප්‍රමාණය සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ආදායම් ප්‍රකාශනයට ගෙන නොතිබීම.

(2) විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු අයිතමයන් පිළිබඳව අවබෝධයක් නොමැති වීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඇතුළත් කළ යුතු සමහර අයිතමයන් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කර තිබුණි.

(3) බොල් ණය වශයෙන් වර්ෂය තුළ ලියා හරින ලද රු.80,000/- ක මුදල සටහන් කර නොතිබුණි.

(4) දළ ලාභය ගණනය කිරීම සඳහා සමහර අයදුම්කරුවන් විසින් වර්ෂයේ මුල් තොගය අඩුකර අවසාන තොග එකතු කර තිබුණි.

(5) ශේෂ පිරික්සුමේ අයිතමයන් දහස් ගණනින් හා ගැලපිළි වල අයිතමයන් සම්පූර්ණ අගයන් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණි.

(6) 2025 මාර්තු මාසයට අදාල වූ රු.150,000/- ක ගබඩා කුලිය නියමිත පරිදි වර්ෂයේ වියදමට ගලපා නොතිබුණි.

(7) ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම වූ රු.8,400,000/- න් ඉඩමේ වටිනාකම වූ රු.2,400,000/- අඩුකර ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.6,000,000/- අදාළව ක්ෂයවීම ගණනය කළ යුතු වුවද අයදුම්කරුවන් විසින් මුළු වටිනාකම වූ රු.8,400,000/- සඳහාම ක්ෂයවීම ගණනය කර තිබුණි.

(8) වෙළඳ ලැබිය යුතු මුදලින් රු.80,000/- බොල් ණය ලියා හැරීමෙන් පසු අඩමාන ණය සඳහා වූ 2% වෙන් කිරීම ගලපා නොතිබිණි.

(9) 2024 ඔක්තෝබර් 01 දින 12% වාර්ෂික පොලියට ලබාගන්නා ලද රු.3,000,000/- බැංකු ණය සඳහා වූ මාස 06 කට අදාල රු.180,000/- පොළී වියදම සටහන් කර නොතිබිණි.

(10) 2025 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලයේ සඳහා රු.120,000/- ක් ගෙවා ලබා ගන්නා ලද ගිනිරක්ෂණ ඔප්පුවේ වියදමට අදාල මාස 03කට අයත් රක්ෂණ වියදම වූ රු.30,000/- නියමිත පරිදි ගළපා නොතිබිණි.

**(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කිරීම:**

(1) වර්ෂය තුළ කපා හරින ලද බොල්ණය හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදන වෙළඳ ලැබිය යුතු මුදල් වලින් අඩු කර නොතිබුණි.

(2) 2024 අප්‍රේල් 01 දිනට වූ සමුච්චිත ක්ෂය වීම එකතු නොකර වර්ෂයේ ක්ෂයවීම පමණක් සමුච්චිත ක්ෂය ලෙස පෙන්වා තිබුණි.

(3) ගෙවිය යුතු ගබඩා කුලිය සටහන් කර නොතිබුණි.

(4) 2024 ඔක්තෝම්බර් 01 දින ලබා ගන්නා ලද බැංකු ණය වෙනුවෙන් අදාල කාල සීමාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් උපචිත බැංකු ණය පොලී වැරදියට ගණනය කර තිබුණි.

(5) 2024 ඔක්තෝම්බර් 01 දින ලබා ගන්නා ලද බැංකු ණය ජංගම නොවන වගකීම් යටතේ ඉදිරිපත් කළ යුතු වුවද සමහර අයදුම්කරුවන් විසින් ජංගම වගකීම් යටතේ ඉදිරිපත් කර තිබුණි.

(6) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු අයිතමයන් පිළිබඳව මූලික අවබෝධයක් නොමැතිකම නිසා මිලදී ගැනුම්, විකුණුම්, ආරම්භක තොගය කුලී ආදායම සහ වෙනත් වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි.

(7) සමහර අයදුම්කරුවන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ අයිතමයන් වර්ගීකරනය සිදු නොකර සියලුම අයිතමයන් එකට සටහන් කිරීම. උදාහරණ: ජංගම නොවන වත්කම්, ජංගම වත්කම්, ස්කන්ධය හා වගකීම්, ජංගම වගකීම් යනුවෙන්.

(8) වෙළඳ ලැබිය යුතු මුදල් ජංගම බැරකම් යටතේ ද වෙළඳ ගෙවිය යුතු මුදල් ජංගම වත්කම් යටතේ ද සටහන් කර තිබුණි.

(9) සමහර අයදුම්කරුවන් විසින් ඉදිරියට කරන ලද රක්ෂණ වියදම් ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කර නොතිබිණි.

(10) ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම ඉදිරිපත් නොකර තනි අයිතමයන් ලෙස ජංගම නොවන වත්කම් යටතේ ඉදිරිපත් ගණනය කර තිබුණි.

\- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:**

1. විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.

2. අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.

3. උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.

4. අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. උත්තර පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.

6. අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න පත්‍ර සහ යෝජිත උත්තර උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍ර තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.

7. මෙම විෂයට අදාළව ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.

8. කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, උත්තර සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.

9. විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.

- * * * -